# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2069/37 - 2018 මැයි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 65

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12 (2) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 12(2) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, සමෙහි ආලේප කරන්නා වූ සියළුම ක්‍රීම් සහ දියර වර්ග (Lotions) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 743 මගින් නිශ්චිත ISO/TR 17276 ප්‍රකාරව විශ්ලේෂණය කිරීමේදී, එම සමෙහි ආලේප කරනු ලබන ක්‍රීම් හා දියර වර්ගවල (Lotions) අඩංගු බැරලෝහ පහත දක්වා ඇති උපරිම සීමාවන්ට අනුකූලවන්නේ නම් මිස එවැනි ක්‍රීම් හා දියර (Lotions) වර්ග නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම හෝ තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ නොකළ යුතු බවට සියළුම නිෂ්පාදකයින්, ආනයනකරුවන්, ඇසුරුම්කරුවන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් වෙත මෙයින් විධාන කරනු ලබේ.

| *බැර ලෝහය* | *අනුමත උපරිම සීමාව* |
|---|---|
| ඊයම් (Lead) (Pb) | 10 mg/kg |
| ආසනික් (Arsenic) (As) | 3 mg/kg |
| රසදිය (Mercury) (Hg) | 1 mg/kg |
| කැඩ්මියම් (Cadmium) (Cd) | 3 mg/kg |

සමෙහි ආලේප කරන ක්‍රීම් හා දියර වර්ග (Lotions) ලෙස සළකනු ලබන්නේ ;

(1) මේකප් ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(2) ක්ලෙන්සින් (පිරිසිදු කිරීම) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(3) මොයිස්චරයිසින් ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(4) කෙස් ඉවත් කිරීමේ ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(5) හිරු රශ්මියෙන් සම පිලිස්සීම වලක්වන ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(6) සුදුවීම සඳහා භාවිතා කරන ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(7) සමෙහි අඳුරු පැහැය නොපෙන්වීම සඳහා භාවිතා කරන (Vanishing) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(8) ශීත (Cold) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(9) අදාළ නියාමන ආයතනය විසින් සමෙහි ආලේප කරන ක්‍රීම් හෝ දියර වර්ග (Lotions) වර්ගයක් ලෙස හඳුනා ගනු ලැබූ වෙනත් ක්‍රීම් සහ දියර වර්ග (Lotions) වර්ග වේ.


1A - PG 4027 — 207 (2018/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම විධානය 2018 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2018 මැයි මස 01 වැනි දින,
කොළඹ දී ය.

05 - 512/1

---

විධාන අංක 66

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) (අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, සමෙහි ආලේප කරන්නා වූ සියළුම ක්‍රීම් සහ ලෝෂන් නිෂ්පාදකයින්, ආනයනකරුවන්, ඇසුරුම්කරුවන්, බෙදාහරින්නන් හෝ වෙළෙන්දන් විසින් පහත දක්වා ඇති තොරතුරු එම එක් සහ සෑම ක්‍රීම් හා දියර වර්ග (Lotions) බෝතලයකම, ඇසුරුමකම හෝ පැකට්ටුවකම, පැහැදිලි ලෙස නොමැකෙන අයුරින් සළකුණු කරනු ලැබිය යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ. කෙසේ වුවද, ග්‍රෑම් 50/මිලි ලීටර් 50 හෝ ඊට අඩු ක්‍රීම් හා දියර වර්ග අඩංගු ඇසුරුම් සඳහා අදාළ තොරතුරු ඇතුළත් කර වෙනම සැකසූ පත්‍රිකාවක් එම ඇසුරුම් සමග නිකුත් කළ හැක.

(1) නිෂ්පාදනයේ නම
(2) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය
(3) ආනයනකරුගේ සහ /හෝ ශ්‍රී ලංකාව තුළ බෙදාහරින්නාගේ නම සහ ලිපිනය
(4) නිෂ්පාදිත රට
(5) සන්නාම නාමය
(6) පරිමාව/බර
(7) කාණ්ඩ හෝ කේත හෝ තොග හඳුනා ගැනීමේ අංකය
(8) නිෂ්පාදිත දිනය
(9) කල් ඉකුත් වීමේ දිනය හෝ පාවිච්චි කිරීම සිදු කළ යුතු අවසාන දින
(10) උපරිම සිල්ලර මිල
(11) අමුද්‍රව්‍ය ලැයිස්තුව
(12) භාවිත කිරීම සඳහා උපදෙස්
(13) අවශ්‍ය වේ නම් අවවාද/අනතුරු ඇඟවීමේ ප්‍රකාශන

එම සමෙහි ආලේප කරන ක්‍රීම් හා දියර වර්ග (Lotions) ලෙස සළකනු ලබන්නේ ;

(1) මේකප් ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(2) ක්ලෙන්සින් (පිරිසිදු කිරීම) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(3) මොයිස්චරයිසින් ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(4) කෙස් ඉවත් කිරීමේ ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(5) හිරු රශ්මියෙන් සම පිලිස්සීම වලක්වන ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(6) සුදුවීම සඳහා භාවිතා කරන ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(7) සමෙහි අඳුරු පැහැය නොපෙන්වීම සඳහා භාවිතා කරන (Vanishing) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(8) ශීත (Cold) ක්‍රීම් සහ දියර වර්ග (Lotions)
(9) අදාළ නියාමන ආයතනය විසින් සමෙහි ආලේප කරන ක්‍රීම් හෝ දියර වර්ග (Lotions) ලෙස හඳුනා ගනු ලැබූ වෙනත් ක්‍රීම් සහ දියර වර්ග (Lotions) වේ.

මෙම විධානය මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2011 මාර්තු 22 දිනැති අංක 1698/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විධාන අංක 35 හි සඳහන් ''දියර වර්ග'' යන්න මෙයින් ඉවත් කරනු ලැබේ.

මෙම විධානය 2018 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2018 මැයි මස 01 වැනි දින,
කොළඹ දී ය.

05 - 512/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.